# ස්වාර්ථය, පරාර්ථය හා බුදුදහම

පූජ්‍ය යෝධකණ්ඩියේ අරියවංස හිමි

## ප්‍රවේශය

ස්වාර්ථය (Self-interest[1]) යනු තමාගේ ශුභ සිද්ධිය යි. පරාර්ථයෙන් (Altruism[2] / Social well-being) අන්‍යයන්ගේ යහ පැවැත්ම අදහස් කෙරේ. බුදුදහම ස්වාර්ථය පමණක් අගයන දහමක් ලෙස ඇතැමෙක් අර්ථ ගන්වති. එහි පරාර්ථ සිද්ධියක් නොමැති බව පෙන්වාදීමට උත්සාහ ගනිති. ස්වාර්ථය හා පරාර්ථය යන ශීර්ෂයෙන් සිදු කෙරෙන මෙම සාකච්ඡාවෙහි අරමුණ ස්වාර්ථයත් පරාර්ථයත් යන ඉගැන්වීම් දෙක ම අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන ප්‍රස්තුත වශයෙන් බුදුදහම තුළ සාකච්ඡා වන ආකාරය මූලාශ්‍රය නයින් පෙන්වා දීම යි.

## හැඳින්වීම

බුදුදහම පිළිබඳ විචාරාත්මක ව සාකච්ඡා කරන ඇතැම් වියත්හු එය ගුඪවාදී වූ ද, කේවල මූලධර්මවාදී වූ ද, අරහත් පරමාදර්ශය තුළ ආත්මාර්ථය ගැබ් වූ ද ඉගැන්වීමක් වශයෙන් පෙන්වා දෙති. එවැන්නවුන් අතර Max Weber, Malford E Spiro, T.R.V. Murti වැන්නවුන් හඳුනාගත හැකි ය. Max Weber තම කෘතිය වන **'Religions of India'** (ඉන්දියාවේ ආගම්) ග්‍රන්ථයෙහි බුදු දහම හුදු ආත්මාර්ථකාමී හෙවත් පෞද්ගලික විමුක්තියක් පිළිබඳ ඉගැන්වීමක් ලෙස විවේචනය කරයි.

> "විමුක්තිය වූ කලි සාකල්‍යයෙන්ම තමා කෙරෙහිම විශ්වාසය පිහිටුවා ලබාගත යුතු පුද්ගලයන්ගේ පෞද්ගලික ක්‍රියාවලියකි. වෙනත් කිසිවෙකුට හෝ සමාජයේ වෙනත් පිරිසකට හෝ ඔහුට උදවු කළ නො හැකි ය. නියම ගුඪවාදයක දැකිය හැකි අසමාජීය ස්වභාවය මෙහි උපරිම තැනකට දියුණු කර ඇත,[3]

අහංකාරය (මානය) හා මමංකාරය (මම ය මාගේය යන හැඟීම යි) යන දෘෂ්ටිග්‍රාහයන් නැති කර ගැනීමට අවසානයේ දී එය සමූලෝත්පාටණය කර දැමීමටත් පරාර්ථ සේවන සිද්ධියටත් උපකාරී වන අතර බෞද්ධ ශික්ෂණයේ අරමුණ එය යි. ඒ අනුව Max Weber ගේ තර්කය වන බුදු දහම ගුඪවාදී අසමාජීය ඉගැන්වීමක් යන්න නිෂ්ප්‍රභ වේ. ඔහු උපතින් කිතුනු බැතිමතෙකු වන බැවින් කිතුනු දර්ශනය ආශ්‍රයෙන් බුදුදහම විග්‍රහ කිරීමට ගත් උත්සාහයක් ලෙස මෙය හඳුනාගත යුතු ය.

මානව විද්‍යාඥයෙකු වූ Malford E. Spiro ගේ **Buddhism and Society (බුදුදහම සහ සමාජය)** නැමති කෘතියෙහි ද ඉහත විචාරකයාගේ අදහසට සමීප දෘෂ්ටියක් ඉදිරිපත් කරයි. ස්පිරෝ පෙන්වාදෙන්නේ බෞද්ධ ඉගැන්වීම්වල පරාර්ථයක් නොමැති බව යි.

> "බුදුදහමේ දක්වෙන විමුක්තිගාමී සමාජය එහි විමුක්තිය පිළිබඳ සංකල්පය මෙන් ම කේවල මූලධර්මවාදී බවත්, විමුක්තිය ලබා ගත හැකි වන්නේ සම්පූර්ණයෙන් ම මූලධර්මවාදී ලෙස සමාජ, දේශපාලන ලෝකය හැම අංශයක් ම ප්‍රතික්ෂේප කිරීමෙන් පමණි.,[4]

ස්පිරෝගේ බුදුදහම පිළිබඳ කියවීම එතරම් පෘථුල වුවක් නො වන බව මෙ මගින් ප්‍රකට කර ගත හැකි ය. ඔහුට බුදුදහමෙහි අවධානය යොමු කරන සමාජ සංස්ථා පිළිබඳ ඉගැන්වීම් දැකිය හැකි සිගාලක සූත්‍රය අමතක වී ඇති සේ ය.

T.R.V. Murti, **The Central Conception of Buddhism** (බුදු සමයේ කේන්ද්‍රීය සංකල්පය) නැමැති තම කෘතියෙහි අරහත් පරමාදර්ශය පහත් පරමාදර්ශයක් ලෙස හඳුන්වයි.

> "රහතන් වහන්සේ පෞද්ගලික වශයෙන් තමා විමුක්තිය ලබා ගැනීමෙන් තෘප්ත වෙයි. ඔහු අවශ්‍යයෙන්ම අනුන්ගේ යහපත ගැන ක්‍රියාශීලි නොවෙයි. අරහත් පරමාදර්ශය තුළ ආත්මාර්ථය ගැබ්ව පවතින අතර රහතන් වහන්සේ කල්පනා කරන්නේ තමා ලෝකයේ වැඩියක් ප්‍රමාද වුවහොත් ලෝකය විසින් තමා යටත් කරගනු ඇත යනුවෙනි."[5]

බෞද්ධ ඉගැන්වීම්වල එන දස පාරමිතා පිළිබඳ විමසීමෙ දී මූර්ති ඉදිරියෙන් කරන තර්කය හුදු ප්‍රලාපයක් බව පැහැදිලි ය. ඒ හැරත් මෙහි උපුටා දක්වා ඇති විවේචන ඉදිරිපත් කරන ලද වියතුන් බුදුදහම පිළිබඳ උනන්දුවක් දැක්වුව ද, ඒ පිළිබඳ ගැඹුරු කියවීමක් නොමැති බව කිවයුතු නො වේ. අනෙක් අතට බුදුසමයෙහි සාකච්ඡා කෙරෙන ස්වාර්ථය සහ පරාර්ථය පිළිබඳ ශාස්ත්‍රීය සාකච්ඡාවක් සඳහා මෙම ප්‍රස්තුත මඟ කියනු ඇත.

### ස්වාර්ථය හා බුදුදහම

ස්වාර්ථය යනු තමා පිළිබඳ අර්ථය යි. තමාගේ දියුණුව, අභිවෘද්ධිය, සංවර්ධනය, කායික, මානසික, පාරිසරික වශයෙන් ඉහළට පැමිණීම ස්වාර්ථය යන්නෙන් අදහස් කෙරේ. අප සාකච්ඡා කරන ප්‍රස්තුතයට අනුව තමාගේ අර්ථය හෙවත් සකලාර්ථ සිද්ධිය තමන් සතු වගකීමකි. අන් ක්‍රමයකට කියතොත් තමාගේ විමුක්තිය තමා විසින් ම ලබා ගත යුතු ය. එය තමාගේ ම ප්‍රත්‍යක්ෂයක් විය යුතු ය. වෙනත් කෙනෙකුට හෝ බාහිර පාර්ශ්වයකට එය ඉටු කර දිය නො හැකි ය.

'මුත්තො'හං භික්ඛවේ සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා.

තුම්හේ'පි භික්ඛවේ, මුත්තා සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා.'[6]

මහණෙනි, මම දෙවියන් පිළිබඳ වූ යම් ක්ලේශාශයෝ වෙත් ද, මිනිසුන් පිළිබඳ යම් ක්ලේශාශයෝ වෙත් ද, ඒ සියලු ක්ලේශාශයන්ගෙන් මිදුණෙමි. මහණෙනි, තෙපි ද දෙවියන් පිළිබඳ වූ යම් ක්ලේශාශයෝ වෙත් ද, මිනිසුන් පිළිබඳ යම් ක්ලේශාශයෝ වෙත් ද, ඒ සියලු ක්ලේශාශයන්ගෙන් මිදුනාහු ය. බෞද්ධ ඉගැන්වීමට අනුව ස්වාර්ථයේ කූටප්‍රාප්තිය අරහත් තත්වයට පත්වීම හෝ බුද්ධත්වයට පත්වීම යි. එ මගින් අන්‍යයන්ගේ හිතසුව පිණිස කටයුතු කිරීම අපේක්ෂිත ය. එය පරාර්ථ සේවනය යි.[7]

තමා විසින් ම දැන අවබොධ කළ යුතු ය (පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති). තමාගේ විමුක්තිය වෙන කෙනෙකුට ගෙන දිය නො හැකි ය (න අඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ). මඩෙහි හොත් තැනැත්තාට අත දීමට මඩෙහි ම සිටින තැනැත්තාට නො හැකි ය. මඩෙන් එගොඩ වුවහොත් මඩේ හොත්තාට එගොඩ වීමට සහාය විය හැකි ය (අත්තානං පළීති පළිපන්නෝ පරං පළීති පළිපන්නෝ).

බෞද්ධ ඉගැන්වීම් අතර කෙරෙන මෙම ප්‍රකාශයන් මගින් බුදු සමය තුළ පරමාදර්ශී ස්වාර්ථ සිද්ධිය අපෙක්ෂා කරන බව ප්‍රකට වේ. එය හුදු ආත්මාර්ථයක් නො වේ. ස්වාර්ථ සිද්ධිය සලසා ගැනීම යනුවෙන් අදහස් කෙරෙනුයේ සමාජයට ගැළපෙන ආදර්ශමත් චරිතයක් ලෙස සමාජගත වීම යි. ස්වාර්ථ සිද්ධිය ඇත්තෙක් වුවහොත් පමණක් පරමාදර්ශී ව පරාර්ථය සලසාලිය හැකි ය. ස්වාර්ථයෙන් තොර පුද්ගලයා මළ තැනැත්තෙකු වැනි ය. ස්වාර්ථ සාධනය සපුරාගත් තැනැත්තා පරාර්ථ සාධනට අපේක්ෂා කරන අතර මුළු ලෝකයට ම නො ඇලී ඉන් ඉවත් වීමට සමත් වේ.[8] මහායාන බුදුදහමේ සාකච්ඡා වන බෝධි චිත්ත සංකල්පය ද ස්වාර්ථ සංකල්පයට සමයාන්තර ව ගොඩ නැගුණකි. ඒ පිළිබඳ විග්‍රහ කරන ශාන්තිදේව පාදයන් මෙසසේ දක්වයි.

'යථාගෘහීතං සුතරෛ - බෝධිචිත්තං පුරාතනෛඃ
තෙ බෝධිසත්ව ශික්ෂායා - මානුපූර්ව්‍යා යථාස්ථිතාඃ'
'තද්වදුපාදයාම්‍යෙෂ - බෝධිචිත්තං ජගද්ධිතෙ
තද්වදේවච තාඃ ශික්ෂාඃ - ශික්ෂිෂ්‍යාමි යථාක්‍රමම්'[9]

යම් සේ බෝධිසත්ත්වයන් වහන්සේලා විසින් බොධි චිත්තය ගන්නා ලද්දේ ද, ඔවුහු අනුපිළිවෙළින් බෝධිසත්ත්ව ශික්ෂාවෙහි සුදුසු පරිදි සිටියාහු ය. එසේ ම ඒ මම ලොවට හිත පිණිස බොධි චිත්තය උපදවමි. එසේ ම ඒ ශික්ෂාවන් ද පිළිවෙළින් පුරුදු කරමි. මෙයින් ප්‍රකට වන්සේ ස්වාර්ථයේ අරමුණ පරාර්ථය බව යි. තව ද, බෞද්ධ ශික්ෂාපදවල අරමුණ පුද්ගලයාගේ පෞද්ගලික විමුක්තිය පමණක් නො වන බව කිව යුතු ය. නිදර්ශන වශයෙන් පඤ්චශීලය පෙන්වා දිය හැකි ය.

1) ප්‍රාණඝාතයෙන් වැළකුණු තැනැත්තා අවි ආයුධ බැහැර කොට සියලු සත්වයන් කෙරෙහි මෙත් සිතින් වාසය කරයි.

2) අදත්තාදානයෙන් මිදුණ තැනැත්තා අන්‍යයන්ගේ වස්තුව රකී.

3) වැරදි කාමයෙන් වැළකුණු තැනත්තා අනිසි ලෙස ඉන්ද්‍රිය පිණවීටම උත්සාහ නො ගනියි. එවැන්නවුන් නිසා සමාජයේ කාම අපරාධ වැළකෙයි. ඉඳුරන් දැමුණු හෙතෙමෙ සමාජයට බොහෝ වැඩ පිණිය හිත පිණිස හැසිරෙයි.

4) මුසාවෙන් වැළකුණු තැනැත්තා සත්‍ය ම පවසයි. විශ්වසනීය වචන තෙපලන හෙතම තම වචනය හේතු කොට අන්‍යයන් අපහසුවට පීඩාවට පත් නො කරයි.

5) ප්‍රමාදයට හේතුවන මත් වීමෙන් වැළකුණු තැනැත්තා අප්‍රමාද වෙයි. ඔහු තමගේ සහ පවුලේ ආරක්ෂාව මෙන් ම අනන්‍යන්ගේ කාර්යසාධනය සඳහා කැපවෙයි.

ඉහත සඳහන් කළ පරිදි බොහෝ බෞද්ධ ආචාරධර්මවල ආධ්‍යාත්මික පක්ෂය සංවර්ධනය කිරීමට සාපේක්ෂක ව මූලික වන බව සත්‍යයකි. එහෙත් සමාජ සහජීවනය යන්නට සාපේක්ෂ ව ගත් කල ආචාරධර්ම බොහෝමයක ම පරහිතකාමීත්වය දැඩි ලෙස අවධාරණය වී ඇති බව පැහැදිලි ය.[10]

## පරාර්ථය හා බුදුදහම

පරාර්ථය යනු අන්‍යයන් පිළිබඳ ශුභ සිද්ධිය යි. අන්‍යයන්ගේ යහ පැවැත්ම යි. අන්‍යයන්ගේ සංවර්ධනය යි. අන්‍යයන්ගේ විමුක්තිය සලසාලීම යි. බෞද්ධ ඉගැන්වීම් තුළ ද ප්‍රකට වන්නේ ජීවිත පරිත්‍යාගයෙන් හෝ අන්‍යයන්ගේ විමුක්තිය සඳහා කටයුතු කළ යුතු බව යි. ස්වාර්ථයක් ඇත්තෙකුට පමණක් ජීවිත පරිත්‍යාග යෙන් පරාර්ථය සිදු කිරීම අගනේ ය. මහාවග්ගපාලියෙහි එන පහත පාඨයෙන් බුදුදහම තුළ ඉගැන්වෙන පරාර්ථය කෙබඳු දැයි අවබෝධ කරගත හැකි ය.

> ‘චරථ භික්ඛවෙ, චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා ඒකෙන ද්වෙ අගමිත්ථ. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ’[11]

මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස ද බොහෝ දෙනාට සැප පිණිස ද ලොවට අනුකම්පා පිණිස ද දෙව්මිනිසුන්ට වැඩ පිණිස ද හිත පිණිස ද චාරිකාවේ හැසිරෙව්. දෙනමක් එක මඟක නො යවු. මහණෙනි, ආදියෙහි යහපත් වූ මධ්‍යයෙහි යහපත් වූ අවසනැ යහපත් වූ අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත වූ සියල්ලෙන් සම්පූර්ණ වූ ධර්මය දෙසව්.

බුදුරජාණන් වහන්සේගේ මෙම අනුශාසනාවෙන් ප්‍රකට වන්නේ බුදු සමයේ ඉගැන්වෙන පරාර්ථය කෙතරම් පරමාදර්ශී වන්නේ ද යන්න යි. බුදු සමය ස්වාර්ථය

වඩාත් අගය කරන බව සත්‍යයකි. ඒ මන්ද යත් ස්වාර්ථයෙන් තොර පරාර්ථයක් නොමැති බැවිණි. සවාර්ථ සිද්ධිය සාක්‍ෂාත් කරගත් තැනැත්තෙකුට පමණක් වඩා යහපත් සමාජ සේවයක් කළ හැකි ය.

ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා (දාන, සීල, භාවනා), ත්‍රිවිධ කුසල මූල (අලෝභ, අදෝස, අමෝහ), දස පුණ්‍ය ක්‍රියා (දානය, සීලය, භාවනාව, පින්දීම, පින් අනුමෝදන් වීම, වතාවත් කිරීම, අපචායනය, ධර්ම දේශනය, ධර්ම ශ්‍රවණය, දැක්ම ඍජු කර ගැනීම), ගිලානෝපස්ථානය (යෝ ගිලානං උපට්ඨහති; සො මං උපට්ඨහති - යහෙන් ගිලනුන්ට උපස්ථාන කරයි ද; හේ මට (බුදුරජාණන් වහන්සේට) උපස්ථාන කළේ වෙයි),[12] සහ සතර සංග්‍රහ වස්තු (දානය, ප්‍රියවචන, අර්ථචර්යා, සමානාත්මතාව) යන ඉගැන්වීම්වල ද වැඩි වශයෙන් සාකච්ඡා කොට ඇත්තේ ස්වාර්ථය හා පාරාර්ථ යන සංකල්ප යි. මෙහි භාවනාව හැර අනෙක් සියලු සංකල්ප තුළ සමාජීය අර්ථය ගැබ් ව ඇත.[13]

බුදු වීමට පෙරුම් පුරන බෝධිසත්ත්වරුන්ගේ චර්යාව විමසීමෙන් ද ස්වාර්ථයෙත් පරාර්ථයෙත් මෙහි අගය තවත් වටහාගත හැකි ය. මේ පිළිබඳ ශාන්තිදේව පාදයන්ගේ බෝධිචර්යාවතාරය නම් කෘතියෙහි මෙසේ දක්වයි.

'එවං සර්වමිදං කෘත්වා - යන්මයා සාදීතං ශුභං
තෙනසය්‍යාං සර්ව සත්ත්වානාං - සර්ව දුඃඛ ප්‍රශාන්තිකෘත්'
'ග්ලානානාමස්මි භෛෂජ්‍යං - භවෙයං වෛද්‍ය එව ච
තදුපස්ථායක්චෛව - යාවද්‍රොගා පුනර්භවඃ'[14]

පූජා, පාප දේශනා, පුණ්‍යානුමෝදනා ආදි මේ සියල්ල කොට උපදවාගනු ලබන කුශලය කරණ කොට ගෙන සියලු සත්ත්වයන්ගේ සියලු දුක් සන්සිඳේවා!. මම ගිලනුන්ට ඖෂධයක් ද, වෙදෙක් ද වෙමි. එ මෙන් ම රෝගියා රෝගයෙන් නැඟී සිටින තෙක් ඔහුට උපස්ථායකයෙක් ද වෙමි.

'යථා සුඛී කෘතශ්චාත්මා - මයා යං සර්ව දෙහිනාං
ස්නන්තු නින්දන්තු වා නිත්‍ය - මාකිරන්තු ච පාංශුභිඃ'
'ක්‍රීඩන්තු මම කායෙන - හසන්තු විලසන්තු ච
දත්තස්තෙභ්‍යො මයා - කායශ්චින්තයා කිං මමානයා'
'කාරයන්තු ච කර්මාණී - යානි තේෂාං සුඛාවහං
අනර්ථඃ කස්‍යචින්මාභූන් - මාමාලම්භ්‍ය කදාචන'[15]

මා විසින් සියලු සත්වයන්ට මගේ මේ ශරීරය කැමති පරිදි සැප ලබා ගැනීම සඳහා පරිත්‍යාග කරන ලදි. එ හෙයින් ඔවුහු මා නසත්වා, නින්දා කෙරෙත්වා, නිතර දූවිලි ආදියෙන් විසුරුවත්වා. මගේ කයින් ක්‍රීඩා කෙරෙත්වා, සිනහසෙත්වා, සැරසීම හෝ කෙරෙත්වා, පරිත්‍යාග කරන ලද දෙය පිළිබඳ මගේ යැයි සිතීමේ සිතුවිල්ලෙන් කවර ප්‍රයෝජනයක් ද? තමා දුකට පත් වී අනුන්ගේ සැපය ආරක්‍ෂා කිරීම උත්තම බෝධිසත්වයන්ගේ චරියාව යි. මෙරමා වෙනුවෙන් පිදූ සිය සිරුර ගැන ඉන්පසු

සිතීම නිශ්ඵල ය. යම් කටයුත්තක් ඔවුන්ට සැප ගෙන දෙන්නේ ද ඒ කටයුත්ත මාගේ ශරීරයට කෙරෙත්වා. කිසි දිනෙක කිසිවෙකුටත් මා අරමුණු කොට ගෙන අනර්ථයක් නො වේවා.

'අනාථානමහං නාථඃ සර්ථවාහශ්ච යායිනාං
පාරෙප්සුනං ච නෞ භූතඃ සෙතුං සංක්‍රම එව ච'
'දීපාර්ථීනාමහං දීපඃ - ශයයා ශභ්‍යාර්ථීනාමහං
දාසාර්ථීනාමහං දාසො - භවෙදෙහිනාම්'
'චින්තාමණිර් භද්‍රඝටඃ - සිද්ධ විද්‍යා මහෞෂධිඃ
භවෙයං කල්පවෘක්‍ෂශ්ච - කාමධෙනුශ්ච දෙහිනාම්'[16] **(03:17,18,19)**

මම අසරණයන්ට සරණක් වෙමි. හව්හරණක් නැත්තවුන්ට පිළිසරණක් ද වෙමි. එතෙරට යනු කැමැත්තවුන්ට නෞකාවක් වෙමි. එගොඩවන්නවුන්ට ඒදණ්ඩක් වෙමි. ආලෝකය කැමැත්තවුන්ට පහනක් වෙමි. සැතැපෙනු කැමැත්තවුන්ට යහනක් වෙමි. දායසයන් කැමැත්තවුන්ට දාසයෙක් වෙමි. තව ද, මම සිතුමිණක්, භද්‍රඝටයක්, සිද්ධමන්ත්‍රයක්, මහෞෂධයක්, කාමධෙනුවක් වෙමින් සත්‍වයන්ට සිතුපැතූ සම්පත් ලබා දෙමි. බොධිසත්ත්‍ව ප්‍රතිපදාවෙහි ගැබ්ව ඇත්තේ මහාකරුණාවත්, මහාප්‍රඥාවත් බව මෙ මගින් විද්‍යමාන වේ.

**අංගුත්තරනිකායෙහි** එන පුද්ගල වර්ගීකරණ අතර වඩා යහපත් පුද්ගලයා කවරෙක් දැයි පෙන්වා දෙයි. එයට අනුව වඩා වැදගත් වන්නේ තමාටත් අන්‍යයන්ටත් අර්ථය ඇති වැඩ ඇති තැනැත්තා ය.

1) නෙව අත්තහිත නො පරහිත

(තමාට හෝ අන් අයට හෝ වැඩක් නැති පුද්ගලයා)

2) පරහිතාය පටිපන්නො නො අත්තහිතාය

(අන් අයට වැඩදායි වුව ද තමාට වැඩක් නැති තැනැත්තා)

3) අත්තහිතාය පටිපන්නො නො පරහිතාය

(තමාට අර්ථයක් ඇතත් අන්‍යයන්ට එසේ නො වන තැනැත්තා)

4) අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච[17]

(තමාටත් අන්‍යයන්ටත් වැඩක් ඇති තැනැත්තා)

මෙහි පළමුවන තැනැත්තා මළ තැනැත්තෙකු වැනි ය. දෙවැන්නා පළමු වැන්නාට වඩා තෙවැන්නා පළමු හා දෙවැන්නාට වඩා හොඳ ය. බුදු සමය අගයන්නේ සිව්වැන්නා ය. ඔහු අග්‍ර ය. ශ්‍රේෂ්ඨ ය. ස්වාර්ථ සිද්ධිය සලසා ගත් ඔහු පරාර්ථයට කැප වූවෙකි.

## සමාලෝචනය

පරාර්ථය අරමුණු කරගත් ස්වාර්ථයේ පරමාදර්ශී බව බෞද්ධ ඉගැන්වීමෙන් විද්‍යමාන වේ. ඒ අනුව ගත් කළ වෙබර්, ස්පිරෝ සහ මූර්ති යන්නවුන් විසින් බුදුසමය පිළිබඳ ගෙතූ තර්ක හුදු ප්‍රලාප බව කිව යුතු නො වේ. අනෙක් අතට ඒ ඒ සන්දර්භ තුළ සාකච්ඡා කෙරෙන ස්වාර්ථය සහ පරාර්ථය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් දාර්ශනික, මනෝවිද්‍යාත්මක, ආධ්‍යාත්මික, සමාජවිද්‍යාත්මක, ආචාරවිද්‍යාත්මක ආදි වැදගත්කම්වලින් ද යුක්ත ය. බුදුදහමේ පරමාර්ථය නිර්වාණාධිගමය වුව ද, එය හුදු ආර්මාර්ථයක් හෙවත් ගුඪවාදයක් නො වේ. හේ මහාකරුණාව පූර්වකොට කටයුතු කරනු කැමැත්තේ සමාජශීලී ය. පරහිතකාමී ය. මාර්ගඵලස්ථ තැනැත්තා ද ලෝකයෙහි නො ඇලි අන්‍යයන්ගේ ආධ්‍යාත්මික විමුක්තිගාමීත්වය ආචාරවිද්‍යාත්මක පදනමක සිට අපේක්ෂා කරන අතර ඒ සඳහා සහාය වන බව ඉහත සාකච්ඡාවෙන් ගම්‍ය වේ.

## ආන්තික සටහන්

1. 'The fact of somebody only considering their own interests and of not caring about things that would help other people' Hornby A.S., (2010), **Oxford Advanced Learner's Dictionary; Eight edition,** Oxford University Press, New York, p. 1388
2. **'The fact of caring about the needs and happiness of other people more than your own'** Ibid, p.43
3. Weber, Max, (1929), **Religions of India**, New York: p. 213 උපුටාගැනීම: ඥානාරාම හිමි පාතේගම, (1996), මුල් බුදුසමය හා විවරණ ගැටලු, බෞද්ධ භාවනා මධ්‍යස්ථානය, සිංගප්පූරුව: පි. 118
4. Malford E Spiro, **Buddhism and Society**, p.65 උපුටාගැනීම: මුල් බුදුසමය හා විවරණ ගැටළු, පි. 119 - 120.
5. Murti T.R.V., **The Central Conception of Buddhism**, p. 263 උපුටාගැනීම: මුල් බුදුසමය හා විවරණ ගැටලු, පි. 120
6. **විනයපිටකය,** (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, දෙහිවල: පි. 42
7. විජිත හිමි පිටිගල, (2016), **මුල් බුදුසමය හා මාධ්‍යමක දර්ශනය**, ශ්‍රී ලංකා පාලි ග්‍රන්ථ සමාගම, වාද්දූව: පි. 78
8. ගල්මන්ගොඩ සුමනපාල, (2012), **ආදි බෞද්ධ දර්ශනය**, සරස්වති ප්‍රකාශන, දිවුලපිටිය: පි. 154
9. ධම්මරතන හිමි ඉඳුරාගාරේ (සංස්), (1989), **බෝධිචර්යාවතාරය**; 3 - 4 පරිච්ඡේද, සමයවර්ධන, කොළඹ 10: පි. 13
10. ගල්මන්ගොඩ සුමනපාල. (2012), **ආදි බෞද්ධ දර්ශනය**, සරස්වති ප්‍රකාශන, දිවුලපිටිය: පි. 155
11. **විනයපිටකය, මහාවග්ගපාලිය,**(2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, දෙහිවල: පි. 42
12. **විනයපිටකය 1**, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, දෙහිවල: පි. 202
13. ඥානාරාම හිමි පාතේගම, (1996), **මුල් බුදුසමය හා විවරණ** ගැටලු, බෞද්ධ භාවනා මධ්‍යස්ථානය, සිංගප්පූරුව: පි. 122 -123
14. ධම්මරතන හිමි ඉඳුරාගාරේ (සංස්), (1989), **බෝධිචර්යාවතාරය**; 3 - 4 පරිච්ඡේද, සමයවර්ධන, කොළඹ 10: පි. 03

15. එම, පි. 07 - 08
16. එම, පි. 10 - 11
17. **අංගුත්තරනිකාය**, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, දෙහිවලඃ පි. 319

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**අංගුත්තරනිකාය**, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, දෙහිවලඃ.

**විනයපිටකය**, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, දෙහිවලඃ

**ගල්මන්ගොඩ සුමනපාල**, (2012), ආදි බෞද්ධ දර්ශනය, සරස්වති ප්‍රකාශන, දිවුලපිටියඃ

ඥානාරාම හිමි පාතේගම, (1996), **මුල් බුදුසමය හා විවරණ ගැටලු**, බෞද්ධ භාවනා මධ්‍යස්ථානය, සිංගප්පුරුව.

ධම්මරතන හිමි ඉඳුරාගාරේ (සංස්), (1989), **බෝධිචර්යාවතාරය**; 3 - 4 පරිච්ඡේද, සමයවර්ධන, කොළඹ 10ඃ

විජිත හිමි පිටිගල, (2016), **මුල් බුදුසමය හා මාධ්‍යමක දර්ශනය**, ශ්‍රී ලංකා පාලි ග්‍රන්ථ සමාගම, වාද්දුවඃ

Hornby A.S., (2010), **Oxford Advanced Learner's Dictionary; Eight edition**, Oxford University Press, New York:

Weber, Max, (1929), **Religions of India**, New York: